## 2019 ඔක්තෝම්බර් මාසය සඳහා අයැදීමට සහ මැදිහත් වීමට අත්වැලක්

**"පරාක්‍රමයාණෝ මා උදෙසා මහත් දේ කළ සේක. පරිශුද්ධයාණෝ යනු එතුමන්ගේ නාමය ය."** (ශු.ලූක් 1:49)

දෙවියන් වහන්සේ සර්වබලධාරිය. සුපරිශුද්ධ ය. එමෙන්ම ඔවුන් වහන්සේ ඉතාමත් දයාන්විත ය. කරුණාබරිත ය, වරදට සමාව දෙන සුළු ය. දැනුවත්වම වැරදි කලොත් ඔවුන් වහන්සේ දඬුවම් පමුණුවන සේක. එසේ කරන්නේ පාපය නිසා මනුෂ්‍යයාගේ ආත්මය විනාශ වීම ඔවුන් වහන්සේගේ කැමැත්ත නොවන බැවිනි.

දෙවියන් වහන්සේ තම ස්වරූපයට මනුෂ්‍යයා මැවූ සේක. ඔවුන්ට මුළු මැවිල්ලේ බාරකාරත්වය සැලසුවේ ය. එසේ ශුද්ධ ලියවිල්ල පරිදි උයන මැද තිබූ තහනම් ගහෙන් ගෙඩි නොකන ලෙස ඔවුන්ට නියෝග කළත්, ඔවුහු යක්ෂයාට රැවටී තහනම් ගහේ ගෙඩි කෑමෙන් දෙවියන් වහන්සේට අකීකරු උන නිසා දුක, වේදනාව, මරණය ඔවුන්ට උරුම විය. ඔවුන්ගෙන් පැවත ආ මුළු මිනිස් සංහතියටම එම පාපයේ විපාක විඳින්නට සිදු විය.

එහෙත් ඔවුන් වහන්සේගේ අසීමිත ප්‍රේමය නිසාම තම දේව බලය, දේව තේජස හිස්කර ජේසුස් ක්‍රිස්තුන් නමින්, කන්‍ය මරිය තුමියගේ කුසයේ ශුද්ධාත්ම වරමින් පිළිසිඳ මෙසියස් හෙවත් ගැලවුම්කරුවාණන් ලෙස මෙලොව ජනිත විය.

එතුමා දෙවියන් වහන්සේගේ රාජ්‍යයේ රහස් එළිදරව් කර සකල මිනිස් වර්ගයාගේම ගැළවීම උදෙසා පාපයේ විපාකය කරට ගෙන කුරුස ගසේ ජීවිතය පූජා කිරීමෙන් සියළුම මනුෂ්‍යයන්ට ස්වර්ගයට ඇතුළු වීමට දොරටු විවෘත කළ සේක.

සහය ගැලවුම්කාරිය වන මරිය මව් තුමිය දේව කැමැත්තට අවනත වෙමින්, එතුමියත් මුළු මිනිස් සංහතිය වෙනුවෙන් මැදිහත් වන සේක.

මෙම මාසය ජපමාලයේ මාසයයි. ඔක්තෝම්බර් මස 07 වන දින ශුද්ධවූ සභා මාතාව ජපමාලා මාතා මංගල්‍යය අනිවාර්ය අනුස්මරණයක් ලෙස පවත්වයි. එබැවින් අයැදීමේ සේවකයන් වශයෙන් මෙම කාලය තුළ පුබුදු ජනතාවක් වශයෙන් ජපමාලය උච්ඡාරණය කරමින් අපගේ දේශය තුළ සමූලික පරිණාමනයක් ඇතිවන ලෙස දින 40ක අඛණ්ඩ මැදිහත් යාච්ඤාවේ යෙදෙයි.

අයැදීමේ සේවකයන් වශයෙන් අපිත් ඊට සහභාගි වී භාග්‍යවන්ත අම්මා සමඟ මැදිහත් අයැදීමේ යෙදෙමු. ඔක්තෝම්බර් මස 17න් පසුව සුපුරුදු ලෙස අපගේ අයැදීමේ පොදු එකතු පවත්වා පුබුදුව, දේශය, ශුද්ධවූ සභාව, ලෝකය සහ ශුද්ධිගිනිස්ථානයේ ආත්ම වෙනුවෙන් අඛණ්ඩව අයැදීමේ යෙදෙමු.

'පරාක්‍රමයාණෝ මා උදෙසා මහත් දේ කළ සේක' යන මෙදා අයැදීමේ සේවකයන් වශයෙන් පුබුදුව හරහා අන් අය වෙනුවෙන් අයැදින්නට අබ්බා අම්මා ! අබ්බා තාත්තා !ගෙන් අපට ලැබුණ විශේෂ වරම වෙනුවෙන් ද, ස්වාමි තාත්තා, දිවැසි එකතුව ඇතුළු පුබුදුව තුළ විවිධ වගකීම් ගන්නා සියළු දෙනා වෙනුවෙන් ද, කාදිනල් උතුමාණන් විසින් අපට දුන් ආත්මීක අධ්‍යක්ෂක රොබින්සන් විජේසිංහ පියතුමා වෙනුවෙන් ද, අපගේ සමස්ථ පුබුදු ජනතාව වෙනුවෙන් ද, පුබුදු ජනතාවට විවිධ අන්දමින් උදව් උපකාර කරන දේශීය විදේශීය සියළු දෙනා වෙනුවෙන් ද භාග්‍යවන්ත අම්මා සමඟ අබ්බා අම්මාට ! අබ්බා තාත්තාට! නිරන්තරයෙන්ම ප්‍රශංසාවට ඇතුළු වීමට ශුද්ධාත්ම සහය පතමු.

**හමුවිය හැකි බැවින්**
**සමිඳුන් සොයා යන්න !**
**ළඟම සිටින බැවින්**
**එතුමන් අයදින්න !**

**පළමු සතිය :** දේශය වෙනුවෙන් කරන මැදිහත් යාච්ඤාවට අදාළ ජපමාන පංති සහ ඊට අදාළ විශේෂ කරුණු වෙනුවෙන් ජපමාලය උච්ඡාරණය කරන්න.

**දිව්‍යමය කියවීම** - 2වංශාවලිය 7:14

**අයැදීමට විශේෂ යොමුව :**

අළුත් අහසක්, අළුත් පොළොවක් අප දේශය තුළ උදා කරනු සඳහා සමස්ථ පුබුදු ජනතාව මේ දින 40 තුළ කෙරෙන අයැදීම් දෙවිඳුන් වෙත එසවෙන පිණිස (විනාඩි 10ක් පමණ)

**වෙනත් අයැදීම් :**

* ඔක්තෝම්බර් මස 6,7,8,9,10 දිනවල ප්‍රශංසාරාමයේ පැවැත්වෙන සුබැඳි දූ - පුතුන්ගේ වාර්ෂික ධර්ම විවේකය තුළින් සුබැඳි සංඝය තුළ ආධ්‍යාත්මික නවෝදයක් ඇතිවනු සඳහා.
* ඔක්තෝම්බර් මස 13 වන දින ප්‍රශංසාරාමයේ පැවැත්වෙන පුබුදු ජාතික පවුල් දිනය වෙනුවෙන්.
* ඔක්තෝම්බර් මස 07 ජපමාල මාතා මංගල්‍යය බැවින්, හැකිනම් දිව්‍ය පූජා යාගයට සම්බන්ධ වන්න. පවුලේ අය එක්වී ජපමාලය උච්ඡාරණය කරන්න.
* වෙනත් අයැදීම් .....

**දෙවන සතිය** : ජපමාලය

**දිව්‍යමය කියවීම** - දින 40ට අදාළ අතදීමේ අද දිනට අදාළ මෙනෙහි කිරීමට ඇතුළු වන්න.

**අයැදීමට විශේෂ යොමුව :**

රටට ආදරය කරන, දූෂණයෙන් තොරවූ, පොදු යහපත උදෙසා කැපවෙන යහපත් පාලකයන් අපට ලැබෙන පිණිස. (විනාඩි 10ක් පමණ)

**වෙනත් අයැදීම් :**

* පිලිකා රෝගය මුළු ලොවින් තුරන් වන පිණිස.
* පිලිකා, වකුගඩු රෝගවලට තුඩු දෙන රසකාරක දැමූ ආහාර, රසායනික පොහොර, අහිතකර කෘමිනාශක යෙදූ එළවළු භාවිතයෙන් රටේ අසරණ ජනතාව ආරක්ෂා වන පිණිසත්, එවැනි දෑ නිෂ්පාදනය කරන අයට තමුන් කරන වැරැද්ද පිළිබඳව අවදි කරන පිණිසත් දකුණත දිගුකර අණ කරමින් යාච්ඤා කරන්න.
* වෙනත් අයැදීම් ....

**තෙවන සතිය** : ජපමාලය

**දිව්‍යමය කියවීම** - දේශය වෙනුවෙන් කෙරෙන මැදිහත් යාච්ඤාවට අදාළ මෙනෙහි කිරීම හෝ යෙසායා 25:6-9

**අයැදීමට විශේෂ යොමුව :**

රසකාරක යෙදූ ආහාර, අහිතකර කෘමිනාශක යෙදූ එළවළු භාවිතයෙන් මිනිස් ජීවිත, සතා සිව්පාවා, ගහ කොළ, ස්වභාව ධර්මය, ජලය විනාශ වන බැවින් ඒ රුදුරු ත්‍රස්තවාදයෙන් අප රටේ දරුවන් ඇතුළු අසරණ ජනතාව මුදා ගන්නා පිණිස.... (විනාඩි 20ක් පමණ)

**වෙනත් අයැදීම් :**

* ප්‍රබෝධය එකතුවට සම්බන්ධ සියළු දෙනා සහ ඔවුන්ගේ වැඩපිළිවෙලවල් වෙනුවෙන්.
* දේශය පුරා දියත් වෙන ජුසේ වාස් පියතුමාගේ ජීවිත චරිතය අළලා කරන නාට්‍ය කණ්ඩායම සහ ඔවුන්ගේ ක්‍රිස්තුදාන වැඩපිළිවෙල වෙනුවෙන්.
* ගොවියන්, ධීවරයන්, කම්කරුවන්, කසල සෝදකයන්, රජයේ සේවකයන්, ඇඟලුම් කර්මාන්තයේ රැකියා කරන අය, යාචකයන්, පතල් කම්කරුවන්, කළුගල් තලන කම්කරුවන් ඇතුළු කුඩා රැකියාවන් කරන සියළු දෙනා වෙනුවෙන්.
* වෙනත් අයැදීම් .....

**සතරවන සතිය** : දිව්‍යමය කියවීම - ශු.මතෙව් 5:3-12 දක්වා පදෙන් පදේ මාරුවන් මාරුවට ගායනා කර ලැබුනු ආලෝකයන් බෙදා ගන්න.

**අයැදීමට විශේෂ යොමුව :**

සෑම කිතුනු පවුලක්ම එකට එකතු වී දිනපතා ජපමාලය උච්ඡාරණය කිරීමට අවස්ථාවක් සැලසෙන පිණිස. (විනාඩි 10ක් පමණ)

**වෙනත් අයැදීම් :**

* ඔක්තෝම්බර් මස 26-27 ප්‍රශංසාරාමයේ පැවැත්වෙන දෙමළ බස කථා කරන සොයුරු සොයුරියන්ගේ වාර්ෂික රැළියට සහභාගි වන ජනවතාව සහ වචනයේ සේවකයන් වෙනුවෙන්.

**විශේෂ අවධානය සඳහා :**

ඉමහත් කැපවීමකින් අයැදීම් සේවාවට මෙන්ම පුබුදු දිවියට ඇතුළු වී ඉතාලි පුබුදු සංඝයේ මූලිකත්වයක් ගත්, සුබැඳි සහ සුරුඳි අයට විශේෂයෙන් ආදරය දැක්වූ **කාන්ති මහීපාල** සොයුරිය, ලෙබනන්හි 'ලක්සෙත' ආයතනයේ සිට එම රටේ සිරගත වී ඇති ශ්‍රී ලාංකිකයන් බැහැදැකීමට ගොස් ඔවුනට උපස්ථාන කර 'ලක්සෙත' නමැති ආයතනයේ ඔවුන් රඳවා ගෙන ඔවුන්ට ජීවමාන ක්‍රිස්තුන් වහන්සේව හඳුන්වා දී පුබුදු දිවියට දිවිය කැප කළ **ඇන්ජෙලා** කන්‍යා මව්තුමිය, ප්‍රශංසාරාමය, මතුගම මධ්‍යස්ථානය, තේවත්ත පුබුදු මුද්‍රණාලයේ වසර ගණනාවක්ම රැඳී සිට,අයැදීම් සේවාවට සම්බන්ධ වෙමින් ආහාර පාන සකස් කර දී ඉමහත් සේවාවක් කළ **ඇලන්** අම්මා, සුබැඳි සොයුරු තිළිණ පුතාගේ පියාවන තඹරවිල සාංඝිකයේ වගකීම් ගෙන ඉමහත් සේවාවක් කළ **රාජා** තාත්තාගේ ආත්මවල් වෙනුවෙන් ඔවුන් උදෙසා පරාක්‍රමයාණෝ ඉමහත් දෙයක් කළ නිසා ප්‍රශංසා කරන අතර, ස්වාර්ගයේ සිට ඔවුන්ගේ මැදිහත් යැදුම අප හා එක් කරන්න කියා අබ්බා අම්මාගෙන් අබ්බා තාත්තාගෙන් ඉල්ලා සිටිමු. (නමෝ මරිය 3ක් ඔප්පු කරන්න)

**ඔවුහු සමාදානයේ වැජඹේවා !**

- අයැදීමේ සහ මැදිහත් වීමේ සේවාව -

****************************